

# 2016

## වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා

සම්මේලන කාර්යාංශය

# පටුන


| | |
|---|---|
| පටුන | 1 |
| ගරු සංචාරක සංවර්ධන අමාත්‍යවරයාගේ පණිවුඩය | 3 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය | 5 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු | 7 |
| විශේෂ අවස්ථා | 8 |
| හැඳින්වීම | 11 |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් | 12 |
| පර්යේෂණ | 13 |
| ප්‍රවර්ධන | 14 |
| වෙනත් ක්‍රියාකාරකම් | 20 |
| මූල්‍ය හා පරිපාලනය | 25 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 26 |
| ආදායම් ප්‍රකාශනය | 27 |
| ගිණුම් සඳහා සටහන් | 28 |
| සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය | 31 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 34 |
| විගණකාධිපතිතුමාගේ මතය | 35 |

# සංචාරක සංවර්ධන, ඉඩම් හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය, ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ඉතා ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතී. විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීම සඳහා ද, සැලකිය යුතු තරුණ තරුණියන් පිරිසකට ප්‍රතිලාභ සැලසෙන රැකියා සැපයීම සඳහා ද උපකාර වන වැදගත්ම අංගයක් ලෙස සංචාරක ව්‍යාපාරය රජයේ ආර්ථික ක්‍රමෝපාය තුළ අන්තර්ගත කර ඇත.

අවසාන මාස 12 ක කාලය තුළ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් දරන ලද ප්‍රබල ප්‍රයත්නය හමුවේ MICE සංචාරක ව්‍යාපාරය සුබවාදී වර්ධනයක් අත්පත් කර ගෙන තිබෙන අතර මෙම ව්‍යාපාරයෙන් මධ්‍ය හා දිගු කාලීන වශයෙන් ලාභාංශ ලබා ගත හැකි ප්‍රවණතාවක් ද පවතී.

මහා පරිමාණයේ MICE උත්සව අවස්ථා සඳහා කලාපීය වෙළඳපොළ සමඟ විශේෂයෙන් ම ඉන්දියාව සමඟ කටයුතු කර උපරිම වාසිය ලබා ගැනීමේ අපගේ ක්‍රමෝපායට අනුව, ඉන්දියානු MICE සමාගම් අංශය මගින් ලාභාංශ ගෙවනු ලබන, ඉන්දියානු MICE සමාගම් අංශයේ ඵලදායී විකල්ප ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පත්වෙමින් සිටියි.

විවේක සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායමට වඩා ඉතා ඉහළ ආදායමක් MICE සංචාරක ව්‍යාපාර අංශයෙන් ලබා ගත හැකි බැවින්, අපගේ සංචාරක ව්‍යාපාර සමූහයේ MICE අංශය එහි සම්පූර්ණ විභවය දක්වා සංවර්ධනය කිරීම අතිශයින්ම වැදගත් වේ.

ප්‍රවාහන හා සැපයුම් සේවා, ආහාර සහ පාන වර්ග, සම්මේලන සේවා, විනෝදාස්වාද කටයුතු ආදී පරිපූරක සේවා තුළින් ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීමට ද MICE සංචාරක ව්‍යාපාර අංශය උපකාරී වන බැවින් MICE සංචාරක ව්‍යාපාර අංශය සංචාරක ව්‍යාපාර සමූහයේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත් වී ඇත.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි MICE සංචාරක ව්‍යාපාර මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන මාර්ගයක් වන්නේ සියලුම පාර්ශ්වකරුවන්ගෙන් මේ සම්බන්ධයෙන් ලැබෙන තිරසාර සහයෝගයයි. ප්‍රශස්ත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මෙම කර්මාන්තයේ මෙතෙක් භාවිතා නොකළ විභවය ඉතා සැලකිලිමත්ව අනාවරණය කර ගැනීම අවශ්‍ය වන අතර ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වර්තමාන සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කර්තව්‍යය මැනවින් ඉටු කිරීමේ හැකියාවෙන් පරිපූර්ණ වූ නිලධාරීන් බව මා අවබෝධ කර ගෙන සිටිමි.

පරිපූර්ණ MICE ගමනාන්තයක් ලෙස අප ඉදිරිපත් කරන නව්‍යකරණ, සේවා හෝ විශේෂ ලක්ෂණ පිළිබඳව ඵලදායී අන්දමින් සන්නිවේදනය කිරීම අප විසින් ජය ගත යුතු එක් ප්‍රධාන අභියෝගයකි. අප ආයතනය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන විශ්ව අලෙවිකරණ ව්‍යාපාරය මගින් ඉහත අභියෝගය ඉතා ඉහළින් ජය ගැනීමට හැකි වන බව මගේ විශ්වාසයයි.

සමාලෝචිත වසර තුළ, පවරන ලද කාර්යභාරය මැනවින් ඉටු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සේවක මණ්ඩලයට මගේ උණුසුම් සුබපැතුම් එක් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ඉදිරි වසර තුළ ද සාර්ථකත්වය ලබා ගැනීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සේවක මණ්ඩලයට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

**ගරු ජෝන් අමරතුංග**
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය

| | |
|---|---|
| ප්‍රේම කුරේ මහතා | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපතිතුමා |
| පී. අල්ගම මහතා | මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කරන නිලධාරී |
| එම්. ශාන්තිකුමාර් මහතා | කොළඹ නගරයේ සංචාරක හෝටල් සංගමයේ (CCTHA) සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතවරයා |
| දේවින්ද්‍ර සේනාරත්න මහතා | රට තුළ සංචාර මෙහෙයුම්කරුවන්ගේ ශ්‍රී ලංකා සංගමයේ (SLAITO) සභාපතිවරයා |
| ජේ. කෙහෙල්පන්නල මහතා | ශ්‍රී ලංකා හෝටල් සංගමයේ (THASL) සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතවරයා |
| මල්රාජ් කිරිඇල්ල මහතා | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා |
| සුනිල් දිසානායක මහතා | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිත |
| මහාචාර්ය දීපාල් මැතිව් මහතා | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) සභාපතිවරයා හෝ උප සභාපතිවරයා |
| රෝහණ කුරුප්පු මහතා | ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) සභාපති හෝ උප සභාපති |
| සියෑන් අමීන් මහතා | ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ උත්සව අවස්ථා සංවිධායකයන්ගේ සංගමයේ (SLAPCEO) සභාපති |
| දිමුතු තෙන්නකෝන් මහතා | ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම මගින් නම් කරන ලද නිලධාරියා |
| දීප්ති ප්‍රනාන්දු මහත්මිය | අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගී වේ |

# ලංකා සම්මුති කාර්යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

## දැක්ම

මනස්කාන්ත වෙරළ, අවංක මිත්‍රශීලී මිනිසුන්, ස්වභාවධර්මයේ මාහැඟි නිපයුම්, සංස්කෘතිය සහ වික්‍රමාන්විත සංචාරවලින් පිරිපුන් ශ්‍රී ලංකාව ආසියාවේ ඉහළම වටිනාකමින් යුත් හරිත වර්ණ දිවයින ලෙස ස්ථාපනය කිරීම හා ස්ථානගත කිරීම. ආසියානු සංචාරක කර්මාන්තයේ ප්‍රධාන පෙළේ සංචාරක ආකර්ෂණයක් ලෙස ශ්‍රී ලංකාවේ ආකෘතිය ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ පාර්ශ්වකරුවන්ට හා සමස්ථ ශ්‍රී ලාංකිකයන්ට ප්‍රතිලාභ සලසන විශාලතම විදේශ විනිමය උපයන්නා බවට ශ්‍රී ලංකාව පත් කිරීම.

## මෙහෙවර

"ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මත යැපෙන පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුළින් ජාතික ආර්ථිකයට දායකත්වයක් සපයන රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන හා ප්‍රදර්ශන ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය (MICE) මගින් උපයනු ලබන විදේශ විනිමයෙන් ඉතා ඉහළ මට්ටමේ ප්‍රශස්ත ආදායමක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් අත්පත් කර ගැනීම.

## අරමුණු

2005 අංක 38 දරණ සංචාරක ව්‍යාපාර පනත (පිටු 32-33) මගින් බලය ලබා දී ඇති 2007 වසරේ සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ අරමුණු පහත දක්වා ඇත.

(අ) අන්තර්ජාතික, කලාපීය හා දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සඳහා රැස් වන ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙන්ම දිරිගැන්වීමේ සංචාර සඳහා ගමනාන්තයක් ලෙස ද ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

(ආ) සමායෝජනය හා සහයෝගීතාව තුළින් ශ්‍රී ලංකාව අන්තර්ජාතික, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන සඳහා රැස් වන ස්ථානයක් ලෙස හා දිරිගැන්වීමේ සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සහ අලෙවි කිරීම තහවුරු කිරීම සඳහා සම්පාදනය කරන ලද පොදු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීම.

(ඇ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පුද්ගලික අංශය මගින් අන්තර්ජාතික, කලාපීය හා දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පවත්වන ස්ථානයක් ලෙස සහ දිරිගැන්වීමේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ දී, සංවර්ධනය කිරීමේ දී සහ සේවා සැපයීමේ දී එම කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා එම කාර්යයන් වෙනුවෙන් සහාය ලබා දීම.

(ඈ) සම්මන්ත්‍රණ, රැස්වීම් හා ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම හා දිරිගැන්වීම් සංචාර වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මෙන්ම එතෙර රටවල සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හා දිරිගැන්වීමේ සංචාරක සංවිධානය කරන පුද්ගලයන් හා ආයතන සම්බන්ධීකරණය කිරීම සහ ඒ සඳහා සහයෝගය ලබා දීම.

(ඉ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන හා දිරි ගැන්වීමේ සංචාරවල විවිධ අංශ මෙහෙයවනු ලබන පුද්ගලයන්ට හා සංවිධානවලට වෘත්තීමය ප්‍රමිති පවත්වාගෙන යෑමට නියම කිරීම හා වෘත්තීමය ප්‍රමිති පවත්වාගෙන යෑම බලාත්මක කිරීම.

(ඊ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන හා දිරිගැන්වීමේ සංචාර මෙහෙයවීමේ නිරතව සිටින විවිධ තරාතිරම්වල පුද්ගලයන් හා සංවිධානවල වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම් ලබා දීම හා ප්‍රවර්ධනය කිරීම.

(උ) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන හා දිරිගැන්වීමේ සංචාර සංවර්ධනය කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරතව සිටින යම් සංගම් හෝ සංවිධාන සමඟ අනුබද්ධ වීම, එහි සාමාජිකත්වය ලබා ගැනීම හා ඒවා සමඟ යම් ගිවිසුම්වලට එළැඹීම.

(ඌ) ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශ රටවල ද ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා අලෙවිකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට මාර්ගෝපදේශ සැපයීම.

(එ) ආගන්තුක සත්කාරක කර්මාන්ත ද ඇතුළත් කරමින් ප්‍රමාණවත්, ආකර්ෂණය හා කාර්යක්ෂම සංචාරක සේවා ලබා දීම තිරසාර අන්දමින් වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධන කිරීම. සහ

(ඒ) ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂාංගික වන සහ හිතකරවන එවැනි සියලුම ක්‍රියාකාරකම් හා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම ස්ථානයක දී සිදු කිරීම.

## SNAV (JEV) ප්‍රංශ සංචාරක නියෝජිතයන්ගේ සම්මේලනය : 2016 ඔක්තෝබර් 31 දින සිට නොවැම්බර් 4 වන දා දක්වා

“The Syndicate National des Agencies de Voyages (SNAV) ලෙස හැඳින් වූ, මේ වන විට Les Enterprises du Voyage (CEV) ලෙස හඳුන්වන මෙම ආයතනය 1944 දී ස්ථාපනය කරන ලද වෘත්තීමය සංවිධානයකි. ප්‍රංශයේ විකුණුම් මධ්‍යස්ථාන 3000 කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින් ප්‍රංශ රජයේ අනුමැතිය ලද සංචාරක නියෝජිතායතන 1500 ක් පමණ මෙම ආයතනය මගින් ඒකරාශී කරන ලදී. ප්‍රංශ සංචාරක නියෝජිතයන්ගේ වාර්ෂික සම්මේලනය වන “Les Journees des Entrepreneurs du Voyages, - JEV 2016” ඔක්තෝබර් 31 දින සිට නොවැම්බර් 4 දින දක්වා සාර්ථක ව ශ්‍රී ලංකාවේ දී පවත්වනු ලැබූ අතර මෙම සම්මේලනයට සහභාගී වීම සඳහා සංචාරක නියෝජිතයන් 286 දෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණියහ. ප්‍රධාන සම්මන්ත්‍රණය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) හා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පවත්වනු ලැබූ අතර ඉන් අනතුරුව සංස්කෘතික ත්‍රිකෝණයේ දී විනෝද යාත්‍රා පවත්වන ලදී.

JEW හි සභාපතිවරයා වන ජීන් පියරේ මෑස් මහතා, “මෙම සම්මන්ත්‍රණය ඉහළම ප්‍රමිතියෙන් යුක්තව සාර්ථකව සංවිධානය කර තිබූ අතර මෙම සම්මන්ත්‍රණය මනාව පැවැත්වීම සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුවට හා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සුභ පැතීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එය ඉතා ආනන්දජනක අත්දැකීමක් විය” යනුවෙන් පැවසුවේය.












Bienvenue
Welcome
LES ENTREPRISES DU VOYAGE


LES ENTREPRISES DU VOYAGE
en collaboration avec
LEVEL...COM
Association des Vendeurs de Voyages en Ligne
srilanka
SriLankan
Slaito
SLAPCEO
ASMET
SRI LANKA
30 OCTOBRE | 5 NOVEMBRE 2016
Congres des Entrepreneurs









# හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ සම්මන්ත්‍රණ සහ රැස්වීම් වැනි අවස්ථා සැලසුම් කිරීමේ දී හා සංවිධානය කිරීමේ දී, සැලසුම්කරුවන් සමඟ මෙන් ම දිරිගැන්වීමේ වැඩසටහන් පිරිනමනු ලබන සමාගම් සහ ව්‍යාපාරික සමාගම් සමඟ සම්බන්ධතා පැවැත්වීමේ ප්‍රධාන ස්ථානය වශයෙන් ද, තොරතුරු, උපදෙස් හා විශේෂඥතාව ලබාගත හැකි සංගමය වශයෙන් ද ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන හා ප්‍රදර්ශන ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය (MICE) හා ජාතික ගුවන් සමාගම සමඟ ඉතා සමීපව කටයුතු කරමින් ශ්‍රී ලංකාව MICE අවස්ථා සඳහා රැස්වීමේ ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම පමණක් නොව ආගන්තුකයන්ගේ මෙන් ම දූත මණ්ඩලවල පූර්ණ තෘප්තිය ඇති කිරීම සඳහා මෙම අවස්ථා වෘත්තීමය අන්දමින් පැවැත්වෙන්නේ දැයි තහවුරු කර ගැනීමේ කාර්ය භාරය ද ඉටු කරයි.

මෙම කාර්යාංශය සේවා ලබා දීම පිළිබඳ විමසීම්වල සිට අලෙවිකරණ අවස්ථා පැවැත්වීම දක්වා වූ පුළුල් පරාසයක සේවා ලබා දෙයි. පර්යේෂණවල නිරතවීම, උත්සව අවස්ථාව පිළිබඳ ලංසු තැබීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා උත්සව අවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට සහාය ලබා දීම ද අත්‍යවශ්‍ය කටයුතු වේ. වෘත්තීය සම්මේලන සංවිධායකයන් තෝරා ගැනීම සම්බන්ධීකරණය කිරීම සඳහා ද, අවශ්‍ය  සියලූම රාජ්‍ය නිෂ්කාශන කටයුතු, ගුවන් සමාගම් හා ගුවන්තොටුපළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු, අවස්ථාව සඳහා සහභාගීත්වය ඉහළ දැමීම සඳහා ප්‍රවර්ධනාත්මක සහාය ලබා දීම සහ සියලූම සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය  සියලූම සහාය සේවා ලබා දීම ආශ්‍රිත සම්බන්ධීකරණ කටයුතු ද මෙම කාර්යාංශය මගින් ඉටු කරයි.

ප්‍රංශ සංචාරක නියෝජිතයන්ගේ සම්මන්ත්‍රණය (SNAV) ට අමතරව, 2016 වසරේ දී අන්තර්ජාතික සම්මන්ත්‍රණ 36 ක් පවත්වන ලදී. ජල සම්පත් හා පරිසරය පිළිබඳ අන්තර්ජාතික දෘෂ්ටිකෝණය පිළිබඳ සම්මන්ත්‍රණය (IPWE) හා අන්තර්ජාතික දන්ත චිකිත්සාව පිළිබඳ සම්මන්ත්‍රණය සහ විද්‍යාත්මක සැසි වාර, පවුල් සෞඛ්‍ය වෛද්‍යවරුන්ගේ දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය (WONCA), ඩෙංගු හා ඩෙංගු රක්තපාත උණ රෝගය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය, කාන්තා අධ්‍යයන කටයුතු පිළිබඳ දෙවන ලෝක සම්මන්ත්‍රණය, සිනමන් ට්‍රැවල් බ්ලොගර්ස් සම්මේලනය, 5 වන ලෝක ඉදි කිරීම් පිළිබඳ දාර්ශනිකයන්ගේ සම්භාෂණය, ඝර්ම කලාපීය සම පිළිබඳ අන්තර්ජාතික සම්මේලනය (ICTD), ජල ශක්ති විද්‍යා පර්යේෂණ පිළිබඳ අන්තර්ජාතික සංගමයේ 20 වන සම්මන්ත්‍රණය ආදිය ඒ අතරින් කීපයකි.

ව්‍යාපාරික සමාගම් රැස්වීම් අංශය ද මනාව ක්‍රියාත්මක වූ අතර ඉන්දියානු ව්‍යාපාරික සමාගම් බහුතරයක් සමඟ ව්‍යාපාරික සමාගම් රැස්වීම් 28 ක සත්කාරකත්වය ශ්‍රී ලංකාව විසින් දරන ලදී. MICE සංචාරක කර්මාන්තය මත ධනාත්මක බලපෑමක් සිදුකිරීමට සමත් වූ උත්සව අවස්ථා කීපයක් සඳහා ද ප්‍රතිරූපය ගොඩ නැංවීම හා ප්‍රසිද්ධියක් ලබාදීම තුළින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් සහාය ලබා දී තිබුණි.



- ජල සම්පත් හා පරිසරය පිළිබඳ අන්තර්ජාතික දෘෂ්ටිකෝණය පිළිබඳ සම්මන්ත්‍රණය (IPWE) -

- sources Environment Conference 2016 -




- ඩෙංගු හා ඩෙංගු රක්තපාත උණ රෝගය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය -

# සාමාන්‍ය ක්‍රියාකාරකම් (උපදේශනය - සමායෝජනය - සම්බන්ධීකරණය)

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මූලික ක්‍රියාකාරකම් MICE (රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන හා අවස්ථා) සංචාරක කර්මාන්තය සඳහා රැස්වීම් පවත්වන ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සෘජු ලෙස බැඳී පවතී. MICE යනු මෙම සේවා ලබා දීම සඳහා වූ කුඩා හා විශේෂීකරණය වූ වෙළඳපොළක් වන අතර එම සංචාරක ව්‍යාපාරය සඳහා විවේක සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන ක්‍රමෝපායවලට වඩා වෙනස් ප්‍රවර්ධන ක්‍රමෝපාය භාවිත කළ යුතුය. සංචාරක කර්මාන්ත පනතේ දක්වා ඇති අරමුණු මත පදනම් වන ක්‍රමෝපාය හතරක් යටතේ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් සිදු කරනු ලබන කටයුතු පුළුල් ලෙස වර්ගීකරණය කළ හැකි වේ. පර්යේෂණ හා සංවර්ධනය, පුහුණු කිරීම්, අලෙවිකරණය සහ පූර්වයෙන් සාමාන්‍ය ක්‍රියාකාරකම් ලෙස දක්වන ලද උපදේශනය, සමායෝජනය හා සම්බන්ධීකරණය යන ව්‍යාපාරයට අදාළ වන ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ කාර්යභාරය තුළින් සිව් වන ක්‍රමෝපාය එළි දැක්වේ.

ඉහත දක්වා ඇති ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ කාර්යභාරයට MICE උත්සව අවස්ථා සඳහා රැස් වීමේ ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන එකම රාජ්‍ය ආයතනය ලෙස සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා ලංසු තැබීමේ කටයුතු, උපදේශනය, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම මෙන්ම වටිනාකම් එකතු කිරීම් ද, දේශීය සංගම්, රජයේ ආයතන හා කර්මාන්තයේ සාමාජිකයන්ට සහාය ලබා දීම වැනි විශේෂීකරණය වූ කටයුතු ද ඇතුළත් වේ.

ජාතික වශයෙන් වැදගත්කමක් සහිත ඇතැම් ප්‍රධාන උත්සව අවස්ථා ද ඇතුළත් ව ඉහත සඳහන් එක් අවධියක් හෝ වැඩි සංඛ්‍යාවක් ඉටු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය නිරත වී ඇති සාමාන්‍ය ක්‍රියාකාරකම් (උපදේශනය, සමායෝජනය, සම්බන්ධීකරණය) කීපයක් පහත දක්වා ඇත.

1.1 TPWE සම්මන්ත්‍රණය - 2016 ජනවාරි මාසයේ දී - පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෑයම මල්එල ගන්වමින් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත වූ, 8 වන ජල සම්පත් හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර දෘෂ්ටිකෝණය සම්මන්ත්‍රණය 2016 ජනවාරි මාසයේ කොළඹ දී සාර්ථකව පවත්වන ලදී. එම සම්මන්ත්‍රණයේ සැලසුම්කරණ අදියර මුළුල්ලේ ම ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය එහි පූර්ණ සහාය ලබා දෙන ලද අතර සහභාගී වූ දූත මණ්ඩල සාමාජිකයන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම හා සංස්කෘතික සංදර්ශනයන් පැවැත්වීම තුළින් මෙම සම්මන්ත්‍රණය සඳහා යම් වටිනාකමක් එක් කර තිබුණි.

1.2 WONCA - පවුල් සෞඛ්‍ය වෛද්‍යවරුන්ගේ දකුණු ආසියා කලාපීය සම්මන්ත්‍රණය 2016 පෙබරවාරි මාසයේ කොළඹ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය මෙම සම්මන්ත්‍රණයේ දේශීය සත්කාරකත්වය දරන ලද අතර මෙම සම්මන්ත්‍රණය සාර්ථකව පැවැත්වීම සඳහා දේශීය අවස්ථා කළමනාකරණ සමාගම වෙත ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සහාය ලබා දෙන ලදී.

1.3 LAWASIA 2016 - 28 වන LAWASIA සම්මන්ත්‍රණය හා LAWASIA හි 50 වන ස්වර්ණ ජුබිලි සැමරුම් උත්සවය ද අගෝස්තු මාසයේ කොළඹ සිනමන් ගාර්ඩ්න් හෝටලයේ දී පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ දේශීය සත්කාරකත්වය දරන ලද ශ්‍රී ලංකා නීතීඥ සංගමය සමඟ ලංසු තැබීමේ අදියරේ සිට මෙම සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ පැවැත්වීම දක්වා ඉතා සමීපව කටයුතු කිරීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සමත් විය.

1.4 APNIC සම්මේලනය - ආසියා පැසිපික් ජාල පරිගණක ඉංජිනේරු සම්මන්ත්‍රණය (APNIC) සැප්තැම්බර් මාසයේ කොළඹ හිල්ටන් හෝටලයේ දී පවත්වන ලදී. ජර්මනියේ පැවැත් වූ IMEX 2016 වෙළඳ ප්‍රදර්ශනය අතරතුර ඇති කර ගත් සම්බන්ධතාවක් ඔස්සේ පසු විපරම් කටයුතු සිදු කිරීම තුළින් මෙම සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට හැකි විය. තෙදිනක් පුරා පැවැත් වූ වැඩමුළුවට විදේශීය තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් 375 කට අධික සංඛ්‍යාවක් හා දේශීය තොරතුරු තාක්ෂණ කර්මාන්ත සාමාජිකයන් සියයකට ආසන්න සංඛ්‍යාවක් සහභාගී වූහ.

දේශීය අනුබද්ධ ආයතන තුළින් 2017 වසර තුළ ලංසු තැබීම ආරම්භ කරනු ලැබීම.

i. බාල චිකිත්සක නියෝජිතයන්ගේ සම්මේලනයේ සම්මුතිය

i i. රුධිර පාරවිලයනය පිළිබඳ ජාත්‍යන්තර සමාජයේ කලාපීය නියෝජිතයන්ගේ සම්මේලනය

i i. පරිසූතික සමාජවල ආසියා ශාන්තිකර නියෝජිතයන්ගේ සම්මේලනය

❖ MICE ගැණුම්කරුවන්ගේ දත්ත පදනම වැඩිදියුණු කිරීම.

❖ ව්‍යාපාරික වීසා සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධතා තහවුරු කර ගැනීම.

## 2016 පෙබරවාරි 13 සිට 2016 පෙබරවාරි 19 දක්වා MICE ප්‍රවර්ධන / මණ්ඩල සමඟ ඒකාබද්ධ ව ප්‍රවර්ධනය කිරීම් / ප්‍රමුඛ පෙළේ MICE මෙහෙයුම්කරුවන් වෙත විකිණුම් ඇමතුම් ලබා දීම.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ලංකා වාණිජ මණ්ඩලය සමඟ ඒකාබද්ධ ව මුම්බායි හි දී 2016 පෙබරවාරි මස 13 - 18 දක්වා පැවැත් වූ “Make in India Week” අවස්ථාවට සමගාමී ව පවත්වන ලද CNN ආසියානු ව්‍යාපාරික සංසදයට (CNN ABF) සහභාගී වූහ.




මුම්බාය පදනම් කරගත් ව්‍යාපාරික සමාගම්, දිරිගැන්වීමේ වැඩසටහන් ලබාදෙන සමාගම්, මාධ්‍ය

ලංකා වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද රැස්වීම්වලට සහභාගී වූ සියලු දූත මණ්ඩලවලට ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳ ව සාමාන්‍ය වශයෙන් හා ශ්‍රී ලංකාවේ MICE ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් ආමන්ත්‍රණය කිරීමට ලැබීමේ වාසිදායක අවස්ථාව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට ලැබුණු අතර OTM වෙළඳ ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට උනන්දුවක් දක්වන රටින් බැහැරට සංචාර මෙහෙයවනු ලබන තැනැත්තන් කීපදෙනෙකු හඳුනා ගැනීමේ අවස්ථාව ද ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට ලැබී තිබුණි. සැලසුම් කළ විකුණුම් ඇමතුම් පැවැත්වෙන අතරතුර දී කොක්ස් ඇන්ඩ් කින්ග්ස්, තෝමස් කුක් හා කේසර ට්‍රැවල්ස් වැනි ප්‍රමුඛ පෙළේ MICE සංචාරක ව්‍යාපාර මෙහෙයුම්කරුවන්ට කරුණු අවබෝධ කර දීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට අවස්ථාව සැලසුණි.

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 2016 මාර්තු 22 සහ 23 යන දිනවල ප්‍රංශයේ පැරිස් නුවර පැවැත් වූ “Meedex Meeting Destination Experts” සම්මේලනයට සහභාගී වූහ.

ප්‍රංශයේ පැවැත් වූ ගමනාන්තයේ ප්‍රවීණයන් හමුවීම - 2016 (Meeting Destination Experts), MICE වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ MICE සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගී වූ අතර / යුරෝපයේ සිට ශ්‍රී ලංකාවට දිරිගැන්වීමේ සංචාරවල නිරතවන්නන් ආකර්ෂණය කර ගැනීමේ මූලික පියවර වශයෙන් ඉතා ධනවත් සේවාලාභීන් අප දිවයින වෙත ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති ප්‍රේමා කුරේ මහතා විසින් ශ්‍රී ලංකා දූත මණ්ඩලය මෙහෙයවනු ලැබූ අතර ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති අතිගරු තිලක් රණවිරාජා මැතිතුමා සහ ජර්මනියේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා වන එම්. රංජිත් ගුණරත්න මැතිතුමා හා ප්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල්වරයා වන ගරු නිහාල් සමරසිංහ මැතිතුමා ද, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමේ ප්‍රංශයේ දේශීය කළමනාකරු, ඩැනි ෂෙපර්ස් මහතා ද ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ කර්මාන්ත සාමාජිකයන් සමඟ මෙම අවස්ථා සඳහා සහභාගී වූහ.






මීඩෙක්ස් 2016 ශ්‍රී ලංකා කණ්ඩායම

මෙහි දී ලබාගත් ජයග්‍රහණ වනුයේ ඉහළම අපේක්ෂා තබා ඇති දිරිගැන්වීමේ ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීමේ සැලසුම් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහ ප්‍රංශ ව්‍යාපාරික සංචාරකයන් අතර හුවමාරු කර ගැනීම මෙන් ම ලොව වටා රැස්වීම් හා උත්සව අවස්ථා සංවිධානය කිරීම පිළිබඳ ව වගකීමෙන් තීරණ ගත හැකි ජ්‍යෙෂ්ඨ පුද්ගලයන්, ගමනාන්ත කළමනාකරණ සමාගම්, වෙළඳ සංචාකරයන් හා නියෝජිතයන් සැලකිය යුතු සංඛ්‍යාවක් මුණ ගැසීමට හා සම්බන්ධතා ඇති කර ගැනීමට ද ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයට හැකියාව ලැබීමයි. සංවිධායකවරයා විසින් ලබා දෙන පූර්වයෙන් සැලසුම් කරන ලද හමුවීම්වලට අමතරව, උදෑසන කෑම ගන්නා අතරතුර හමුවීමක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් පවත්වනු ලැබූ අතර ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති, අතිගරු තිලක් රණවිරාජා මහතා, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති හා ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගමේ කළමනාකරු විසින් ඉදිරිපත් කිරීමේ සැසිවාර පවත්වන ලදී.

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ජර්මනියේ MICE සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරයි.

ලොව ඉහළම පෙළේ, ධනවත් සේවාලාභීන් මෙරටට ආකර්ෂණය කර ගැනීම සඳහා ජර්මනියේ පැවැත් වූ MICE වෙළඳ ප්‍රදර්ශනය වන "IMEX 2016" සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගී වූ අතර මෙය යුරෝපයේ සිට ශ්‍රී ලංකාව වෙත දිරිගැන්වීමේ සංචාර සඳහා සහභාගී වන සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට ගන්නා ලද සෘජු ප්‍රවේශයක් වේ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති ප්‍රේම කුරේ මැතිතුමා ශ්‍රී ලංකා දූත මණ්ඩලයට මඟ පෙන්වන ලද අතර ජර්මනියේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා වන එම්. රංජිත් ගුණරත්න මැතිතුමා ද, ප්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල්වරයා වන ගරු නිහාල් සමරසිංහ මැතිතුමා සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගමේ ජර්මනියේ දේශීය කළමනාකරු, ශාරුක වික්‍රම ආදිත්‍ය මහතා සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛපෙළේ MICE ව්‍යාපාරික සාමාජිකයන් ද මෙම උත්සව අවස්ථා සඳහා සහභාගී වූහ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් සිදුකරන ලද පසු විපරම් කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන්, IMEX සම්මන්ත්‍රණය අතරතුර ආසියා ශාන්තිකර ජාල පරිගණක ඉංජිනේරු සම්මන්ත්‍රණය (APNIC) - 2016 ශ්‍රී ලංකාවේ පැවැත්වීම තහවුරු කරන ලදී. ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්තයේ පිහිටි ආසියා ශාන්තිකර ජාල පරිගණක තොරතුරු මධ්‍යස්ථානයේ ව්‍යාපෘති කළමනාකරු වූ බිලැන්ඩයින් කසින් සමඟ IMEX 2016 සම්මන්ත්‍රණය අතරතුර මූලික සම්බන්ධතා පවත්වන ලදී. දේශීය හා විදේශීය තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් 400 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ තෙදින සම්මන්ත්‍රණය හා ඉන් අනතුරුව පැවැත් වූ පස් දින වැඩමුළුව ද කොළඹ හිල්ටන් හෝටලයේ දී සාර්ථකව පවත්වන ලදී.







ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ජර්මනියේ MICE සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරයි

## 2016 අප්‍රේල් 7 හා 8 වන දිනවල දිල්ලියේ පැවැත් වූ MICE සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ MICE සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා Gurgaon හා නව දිල්ලියේ දී දින දෙකක් මුළුල්ලේ පැවැත් වූ මාර්ග දැක්ම ප්‍රදර්ශන අතරතුර ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් අනුගමනය කරන ලද ක්‍රමෝපාය සාර්ථක විය. 2016 අප්‍රේල් 7 වන දා "ශ්‍රී ලාංකික සන්ධ්‍යාව" ඇමෙරිකානු වාණිජ මණ්ඩලයේ දිල්ලි ශාඛාව හා ශ්‍රී ලංකා ශාඛාව හා ඒකාබද්ධව 2016 අප්‍රේල් 7 වන දින Vivanta by Taj හි දී පවත්වන ලදී. "ශ්‍රී ලංකාවේ දී රැස් වෙමු" අප්‍රේල් 8 වන සෙනසුරාදා දින නවදිල්ලි උද්‍යානයේ දී ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමඟ එක්ව පවත්වන ලදී.

මෙම දෙදින පුරා අනාගතයේ MICE සංචාර ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණින් යුක්තව කර්මාන්තයේ නියුක්ත සමාගම් 100 කට අධික සංඛ්‍යාවක් සංචාර සැලසුම්කරුවන් හා සංචාර මෙහෙයුම්කරුවන් සමඟ එක්ව අන්‍යෝන්‍ය සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ උත්කෘෂ්ඨ සැසිවාර පවත්වන ලදී.

මෙම දෙදින සන්ධ්‍යාවේ ශ්‍රී ලාංකික සංස්කෘතිය විදහා දක්වමින් ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නර්තන ශිල්පීන් විසින් ඉදිරිපත් කරන ලද නර්තන සංදර්ශනය ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ලබා දුන් සුවිශේෂී අත්දැකීමක් විය. මහ කොමසාරිස්, අතිගරු අසේල වීරකෝන් මැතිතුමා, නියෝජ්‍ය මහ කොමසාරිස් ගරු ලේනගල මැතිතුමා, ප්‍රධාන උපදේශක (විශේෂ ව්‍යාපෘති) සී. සෙන් මහතා හා ඉන්දියානු සංචාර මෙහෙයුම්කරුවන්ගේ සංගමයේ (IKTO) සභාපති සුබාෂ් ගෝයල් මහතා ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

## හයිද්‍රාබාද් නගරයේ දී ඒකාබද්ධව පැවැත් වූ MICE ප්‍රවර්ධන කටයුතු

ව්‍යාපාරික සමාගම්, දේශයෙන් පිටතට ගමන් කරන MICE නියෝජිතයන් හා හයිද්‍රාබාද් හි තොරතුරු තාක්ෂණ පුරෝගාමීන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලද අතර 2016 ජුලි 14 - 15 යන දිනවල ඉන්දියාවේ හයිදරාබාද් හි දස දිනක් පුරා ශ්‍රී ලංකා ආහාර උත්සවය පවත්වන ලදී.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපතිවරයා හා ශ්‍රී ලංකා එයාර්ලයින්ස් ගුවන් සමාගමේ කළමනාකරු විසින් නායකත්වය ලබා දුන් මණ්ඩල සාකච්ඡා සඳහා සත්කාරකත්වය ලබාදීම මගින් MICE සංචාරක ව්‍යාපාර සමාගම් හමු වී සම්බන්ධතා ආරම්භ කිරීමට සම්මුති කාර්යාංශය කටයුතු කරන ලදී. MICE සංචාරක නියෝජිතයන් සමඟ එම සන්ධ්‍යාවේ දී පැවැත් වූ ද්වි පාර්ශ්වික හමුවීම් තුළින් තොරතුරු හුවමාරු කර ගැනීමට හා වෘත්තීය හා සමාජ සම්බන්ධතා ඇති කරගැනීමේ අවස්ථාව ලැබුණු අතර එමගින් MICE ක්‍රියාකාරකම් සඳහා වූ ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව ලැබුණි.






හයිදරාබාද් නගරයේ දී ඒකාබද්ධව පැවැත් වූ MICE ප්‍රවර්ධන කටයුතු

## ඉන්දියාවේ තෝමස් කුක් සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සමඟ ඒකාබද්ධ MICE ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.

මුම්බායේ දී ව්‍යාපාරික සමාගම් අතරින් විශිෂ්ඨතම සමාගම් සඳහා 2016 ජුලි 29 වන දින ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. ඉතා ධනවත් ඉන්දියානු වෙළඳපොළ සමඟ සම්බන්ධතා වැඩි දියුණු කර ගනිමින් අනාගත ව්‍යාපාරික සමාගම්වල රැස්වීම් සඳහා සත්කාරකත්වය දැක්වීමේ හා දිරි ගැන්වීමේ සංචාර සඳහා සත්කාරකත්වය දක්වන ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සමත් විය.

## CIBTM 2016 - චීනය

මෙය චීනයේ බීජිං නුවර දී සැප්තැම්බර් 07 හා 08 යන දෙදින පවත්වනු ලැබීය. සැණකෙළිය අතරතුර පූර්වයෙන් සැලසුම් කළ හමුවීම්, පූර්වයේ සැලසුම කළ ගැණුම්කරුවන් සමඟ රැස්වීම්, අන්‍යෝන්‍ය හමුවීම් සැසිවාර හා ගමනාන්තය පිළිබඳ ඉදිරිපත් කිරීම් හා පුවත්පත් දැන්වීම් ප්‍රචාරය කිරීම් මෙම අවස්ථාවේ දී පවත්වන ලදී. චීනය පදනම කරගත් ව්‍යාපාරික සමාගම්, දිරිගැන්වීමේ වැඩසටහන් ලබාදෙන සමාගම් හා සංචාරක නියෝජිතයන් මෙහි ඉලක්ක කණ්ඩායම් විය.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ලොව හරහා රැස්වීම් හා අවස්ථා සංවිධානය කිරීම සඳහා වගකිව යුතු ජ්‍යෙෂ්ඨ තීරකයන් හමු වී ඔවුන් සමඟ සම්බන්ධතා ආරම්භ කරන ලද අතර ගමනාන්ත කළමනාකරණ සමාගම් සහ ව්‍යාපාරික අමුත්තන් හා නියෝජිතයන් සැලකිය යුතු සංඛ්‍යාවක් හමුවීමට ද සම්මුති කාර්යාංශයට හැකි විය. සංවිධායකයා විසින් ලබා දුන් පූර්වයෙන් සැලසුම් කළ හමුවීම්වලට අමතරව, මෙම කාර්යාංශය මගින් ඉදිරිපත් කිරීමේ සැසියක් ද පවත්වන ලදී.





## ඩුබායි හි පවත්වන ලද MICE ප්‍රවර්ධනය

එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ ව්‍යාපාරික සමාගම්වල රැස්වීම් හා දිරිගැන්වීමේ සංචාර සම්බන්ධ වෙළඳපොළේ වැදගත් බව අවබෝධ කරගනිමින් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සමඟ එක්ව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් ප්‍රවර්ධන කටයුතු නැවත වරක් උද්‍යෝගිමත්ව සිදු කිරීමට කටයුතු කරන ලදී.

කර්මාන්තයේ  පාර්ශ්වකරුවන් අතර ද්විපාර්ශ්වික රැස්වීම් හා සන්ධ්‍යාවේ පැවැත් වූ අන්‍යෝන්‍ය හමුවීම් සැසිවාර සමඟ මෙම වසරේ එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ දී පැවැත් වූ දේශය ප්‍රවර්ධනය කිරීමේ පළමුවන මෙහෙවර ඔක්තෝබර් 5 වන දින ඩුබායි රාජ්‍යයේ පුල්මන් සිටි සෙන්ටර් හෝටලයේ දී පවත්වන ලදී.

ඩුබායි, අබුඩාබි හා සාජා පදනම් කර ගත් එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ MICE ගැණුම්කරුවන් 100 දෙනෙකුට අධික සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සපැමිණියහ. MICE කර්මාන්තයේ නායකයන් ද පැමිණි මෙම අවස්ථාව සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගමේ ඩුබායි කාර්යාලයේ පවතින ප්‍රබල සම්බන්ධතා ජාලයේ පූර්ණ වාසිය ලබා ගැනීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සමත් විය.

එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යය පදනම් කර ගත් ගැණුම්කරුවන්, විශේෂයෙන් ම පූර්වයෙන් ශ්‍රී ලංකාව ඔවුන්ගේ සේවාලාභීන් හට අලෙවිකර නොමැති ගැණුම්කරුවන් මුණගැසීමේ අවස්ථාව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ MICE ව්‍යාපාරික සාමාජිකයන් වෙත ලබා ගැනීමේ අවස්ථාව හිමි විය. සන්ධ්‍යාවේ පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමේ සැසිවාරය අතරතුර ඔවුන්ගේ සංවාද අඛණ්ඩව පවත්වාගෙන යෑමට ද ඔවුන්ට හැකි විය.

MICE ක්‍රියාකාරකම් සඳහා නව ආකර්ෂණීය ස්ථාන හා නිෂ්පාදන සමඟ MICE සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාව ආරාධිතයන්ගේ මීළඟ තෝරාගැනීම විය යුත්තේ කුමක් නිසාද යන්න සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් පැවැත් වූ අතර ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයට ඔවුන් ලබාදෙන සේවා පිළිබඳ විස්තරයක් ලබා දෙන ලදී.

## ස්පාඤ්ඤයේ බාර්සිලෝනා හි පැවැත් වූ වෙළඳ සැණකෙලිය, IBTM WORLD 2016

අප දේශය වෙත ඉතා ධනවත් සේවාලාභීන් ආකර්ෂණය කර ගැනීම සඳහා ස්පාඤ්ඤයේ බාසිලෝනා නගරයේ දී පසුගිය සතියේ පැවැත් වූ IBTM WORLD 2016 නමින් යුරෝපයේ පවත්වන විශාලතම MICE වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගී විය. මෙය යුරෝපයේ සිට ශ්‍රී ලංකාව වෙත MICE සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහා අනුගමනය කළ ඍජු ප්‍රවේශයක් විය.

රටවල් 73 ක් සහ ගමනාන්ත 150 කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින් IBTM WORLD සහභාගී වූ MICE කර්මාන්තයේ වෘත්තිකයන් 15,500 කට අධික සංඛ්‍යාවකට ශ්‍රී ලංකාව පිළිබඳව දැවැන්ත ප්‍රසිද්ධියක්  ලබා දීම සඳහා IBTM WORLD වෙළඳ සල්පිල මගින් සත්‍ය වශයෙන් ම ඉතා පුළුල් අවස්ථාවක් සලසා දෙන ලදී.



## හම්බන්තොට සම්මුති මධ්‍යස්ථානය හා ෂැන්ග්‍රිලා හම්බන්තොට සේව්‍යස්ථානය හා ස්පා පරීක්ෂා කිරීමේ අරමුණින් පරිශ්‍රය නැරඹීමට යාම

දේශීය MICE කර්මාන්තයේ සාමාජිකයන් සඳහා හම්බන්තොට සම්මුති මධ්‍යස්ථානය (HICC) හා ෂැන්ග්‍රිලා හම්බන්තොට සේව්‍යස්ථානය හා ස්පා නැරඹීම සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් පහසුකම් සලසා දෙන ලදී.

වෘත්තීය සම්මන්ත්‍රණ සංවිධාකයන්, උත්සව අවස්ථා කළමනාකරණ සමාගම්, ගමනාන්ත කළමනාකරණ සමාගම්, හෝටල් හා ස්ථාන නියෝජනය කරමින් සහභාගී වූ සංචාරක කර්මාන්තයේ නිරත සාමාජිකයන් 35 දෙනෙකු පරිශ්‍ර නැරඹීමේ චාරිකාවට සහභාගී වූහ. මෙය හම්බන්තොට සම්මුති මධ්‍යස්ථානය (HICC) නැරඹීම සඳහා ඔවුන්ට ලැබුණු පළමු අවස්ථාව විය.






සමාලෝචිත වසර තුළ, අදාළ සංවිධායකයන්ට අවශ්‍ය පරිදි ශ්‍රී ලංකාවේ පවත්වන ලද / පැවැත්වීමට නියමිත පහත සඳහන් උත්සව අවස්ථා සඳහා ලංසු තැබීම පිළිබඳව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ තාක්ෂණික විශේෂඥතාව ලබා දෙන ලදී.

| **දිනය** | **දේශීය උත්සව අවස්ථා සංවිධායක** | **උත්සව අවස්ථාව** |
|---|---|---|
| ජනවාරි 04-06 | සිවිල් ඉංජිනේරු අධ්‍යන අංශය - පේරාදෙණිය | IPWE සම්මන්ත්‍රණය |
| ජනවාරි 14-17 January | අන්තර්ජාතික බාල් නැටුම් නර්තන ශිල්පීන්ගේ පෙඩරේෂණය 5 වන | අන්තර්ජාතික නර්ථන සහ සැල්සා උත්සවය 2015 - 2016 |
| ජනවාරි 15-18 Jan | සීමාසහිත ඒයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - 75 දෙනෙක් සඳහා |
| ජනවාරි 18-21 Jan | සීමාසහිත ඒයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම 170 දෙනෙක් සඳහා |
| ජනවාරි 21-Jan | ශ්‍රී ලංකා ළමා විකිත්සකයන්ගේ විද්‍යාලය | 2018 වසරේ දී 16 වන APCP සඳහා සහ 2021 දී 17 වන APCP සඳහා ලංසු තැබීම |
| ජනවාරි 27-පෙබ. 01 | ශ්‍රී ලංකා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ විද්‍යාලය | 32 වන වාර්ෂික අධ්‍යයන සැසිවාරය |
| ජනවාරි 29-31 Jan | LECS | යාපනය අන්තර්ජාතික වෙළඳ සල්පිළ 2016 |
| පෙබරවාරි 27 | ශ්‍රී ලංකා දන්ත වෛද්‍යවරුන්ගේ විද්‍යාලය | ශ්‍රී ලංකා දන්ත වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ වාර්ෂික විද්‍යාත්මක සැසිවාර |
| පෙබරවාරි 12-14 | සීමාසහිත ඒයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | 40 දෙනෙකු ඉන්දියානු MICE කණ්ඩායම - ඉහළම පෙළේ කොටස් වෙළඳුන් |
| පෙබරවාරි 15-19 | Lanka Sportreizen | GITAM විශ්ව විද්‍යාලයේ MBA සිසුන් ශ්‍රී ලංකාවේ සංචාරය කරයි |
| පෙබරවාරි 19 | Serendivus සම්මන්ත්‍රණය | දෙවන ICBME 2016 |
| පෙබරවාරි 09-12 | FTS දූපතේ නිවාඩු දින ගත කිරීම | සීමාසහිත VOLVO India සමාගමෙන් MICE කණ්ඩායම |
| පෙබරවාරි 5-7 | ශ්‍රී ලංකා දන්ත විකිත්සක සංගමය | අන්තර්ජාතික දන්ත විකිත්සක සම්මන්ත්‍රණය සහ විද්‍යාත්මක සැසිවාර |
| පෙබරවාරි 18-මාර්තු 1 | Golden isle සංචාරය | 50 _ ජාත්‍යන්තර එක් දින තරඟාවලිය |
| පෙබරවාරි 12-14 | ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යාලය | WONCA - පවුල් සෞඛ්‍යය වෛද්‍යවරුන්ගේ දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය 2016 |
| පෙබරවාරි 19-21 | | |
| පෙබරවාරි 24-26 | වසංගත රෝග ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය | ඩෙංගු සහ ඩෙංගු රක්තපාත උණ රෝගය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2016 |
| මාර්තු 8-10 | ලංකා වාණිජ මණ්ඩලය | Invest Sri Lanka 2016 |
| මාර්තු 20-23 | රෙඩ් ඇපල් ට්‍රැවල් ඇන්ඩ් හොලිඩේස් ලංකා (පුද්) සමාගම | 38 වන කාර්මික වායු පිළිබඳ සම්මන්ත්‍රණය SIG - AIIGMA |

| | | |
|---|---|---|
| අප්‍රේල් 13-16 | සීමාසහිත වීට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - ඇක්සො නොබෙල් |
| අප්‍රේල් 22-24<br>මැයි 05-06 | සීමාසහිත ජෙට්වින්ග් ට්‍රැවල්ස් (පුද්) සමාගම<br>TIIKM | ඉන්දියානු MICE කණ්ඩායම - ඇක්සිස් රිටේල්<br>කාන්තා අධ්‍යයන පිළිබඳ 2 වන ජගත් සම්මන්ත්‍රණය 2016 |
| මැයි 13-17 | රෙඩ්බුල් | Dougie Lampkin - ශ්‍රී ලංකා සංචාරය 2016 |
| මැයි 16 | සීමාසහිත ජෙට්වින්ග් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - Barbeque International |
| මැයි 16-21 | සීමාසහිත ජෙට්වින්ග් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - ස්මිත්ස් මෙඩිකල් ඉන්ඩියා (පුද්) සමාගම |
| මැයි 18-21 | සීමාසහිත ජෙට්වින්ග් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - ජේ කේ ටයර්ස් |
| මැයි 21-25 | සීමාසහිත වීට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - ජනලක්ෂ්මී මූල්‍ය සේවා |
| ජූනි 7 | සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස් | සිනමන් ට්‍රැවල් බ්ලොගර්ස් සම්මන්ත්‍රණය |
| ජූනි 18-20 | ශ්‍රී ලංකා හදවත් සංගමය | වාර්ෂික අධ්‍යයන සැසිවාර සහ ශ්‍රී ලංකා හදවත් සංගමයේ අර්ථකථන ලබා දීමේ රැස්වීම් |
| ජූනි 28-30 | TIIKM | ICCS 2016 |
| ජූලි 28-29 | TIIKM | ICOPH 2016 |
| ජූලි 8-10 | ජාතික වාණිජ මණ්ඩලය | ආයුර්වේද එක්ස්පෝ 2016 |
| ජූලි 21-22 | ඒෂියා ටුවර්ස් ඇන්ඩ් ඉවෙන්ට්ස් | ආහාර ජීරණ පද්ධතිය සම්බන්ධ ශ්‍රී ලංකා සංගමයේ අධ්‍යයන සැසිවාර 2016 |
| ජූලි 24-27 | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ 129 වන සංවත්සරික අන්තර්ජාතික වෛද්‍ය සම්මේලනය 2016 |
| ජූලි 29-31 | ලංකා ගොඩනැගිලිකරුවන්ගේ ආයතනය | 5 වන ජගත් ඉදි කිරීමේ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය 2016 |
| අගෝස්තු 8-10 | ශ්‍රී ලංකා පරිගණක සංගමය | 34 වන ජාතික තොරතුරු තාක්ෂණික සම්මන්ත්‍රණය - NITC 2016 |
| අගෝස්තු 12-16 | ශ්‍රී ලංකා නීතිඥ සංගමය - ශ්‍රී ලංකා | LAWASIA 2016 |
| අගෝස්තු 11-14 | සම පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ශ්‍රී ලංකා විද්‍යාලය | ඝර්ම කලාපීය සම පිළිබඳ විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ෂකඔෘ) |
| අගෝස්තු 13-14 | 8 වන ඇපලෝ අන්තර්ජාතික සායනික පෝෂණ යාවත්කාලීන කිරීම 2016 | ජෙට්වින්ග් උත්සව අවස්ථා |

| | | |
|---|---|---|
| අගෝස්තු 13-17 | සීමාසහිත ඒට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියාවේ බොම්බාය නගරයේ වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයෙන් පැමිණි MICE කණ්ඩායම |
| අගෝස්තු 18-20 | කෝට්ටේ නෘත්‍ය ශාලාව | ASSITEJ - Asia Meeting 2016 |
| අගෝස්තු 17-20 | ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යාලය | ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ වාර්ෂික අධ්‍යයන සැසිවාර |
| අගෝස්තු 21-27 | Connaissance De Ceylan | ලංකා චැලේන්ජ් 2016 |
| අගෝස්තු 23-24 | මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අධ්‍යනාංශය | ප්‍රවාහණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය |
| අගෝස්තු 26-28 | | ICAP 2016 |
| අගෝස්තු 28-31 | සීමාසහිත ඒට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | අන්තර්ජාතික ජල විද්‍යා පර්යේෂණ පිළිබඳ 20 වන සම්මේලනය |
| සැප්තැම්බර් 1-3 | කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල | ICTer 2016 |
| සැප්තැම්බර් 1-9 | ද කළම්බු ෆෝර්ට් හොටෙල් | ස්ටෙපනී බාර්ට්ගේ ළමා අධ්‍යපන සංසදය - Child Evangelish Followship |
| සැප්තැම්බර් 2-4 | විකරණවේදීන්ගේ ශ්‍රී ලංකා විද්‍යාලය | විකරණවේදීන්ගේ ශ්‍රී ලංකා විද්‍යාලය වාර්ෂික අධ්‍යයන සැසිවාර |
| සැප්තැම්බර් 5*9 | Luxe Asia | ඉන්දියානු MICE කණ්ඩායම - 50 Pax JK Ansel Group |
| සැප්තැම්බර් 8-10 | SAIDIP conference secretariat Sri Lanka | DIPAP SAIDIP conference 2016 |
| සැප්තැම්බර් 21-23 | නැව් නියෝජිතවරුන්ගේ ඇකඩමිය - කොළඹ | කොළඹ අන්තර්ජාතික සමුද්‍ර සම්මන්ත්‍රණය Colombo - CIMC 2016 |
| සැප්තැම්බර් 22-24 | රක්තවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ ශ්‍රී ලංකා විද්‍යාලය | රක්තවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ ශ්‍රී ලංකා විද්‍යාලයේ වාර්ෂික අධ්‍යයන සැසිවාර |
| සැප්තැම්බර් 25-28 | කොළඹ විශ්ව විද්‍යාලය | සංචාරක නායක සමුළුව 2016 |
| සැප්තැම්බර් 28 සිට ඔක්තෝබර් 02 | APNIC 42 සම්මන්ත්‍රණය/ කොළඹ හිල්ටන් හෝටලය ඉවෙන්ට් ප්‍රොඩක්ෂන්ස් | APNIC 42 සම්මන්ත්‍රණය |
| සැප්තැම්බර් 22-25 | ග්ලෝබල් ෂේපර්ස් කමියුනිටි - කොළඹ | ෂේප් සවුත් ඒෂියා 2016 සම්මන්ත්‍රණය |
| ඔක්තෝබර් 16 | ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය | පොදු රාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය සංගමයේ 24 වන ත්‍රෛවාර්ෂික සම්මන්ත්‍රණය |
| ඔක්තෝබර් 14-15 | අන්තර්ජාතික බාල් නැටුම් නර්තන ශිල්පීන්ගේ පෙඩරේෂනය | 5 වන අන්තර්ජාතික නර්ථන සහ සැල්සා උත්සවය 2015-2016 |
| ඔක්තෝබර් 21-24 | Catapullt Lanka | FAM tour - ඉන්දියානු නියෝජිතයන් |

| | | |
|---|---|---|
| ඔක්තෝබර් 24-27 | අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | 40 වන ජාතික ඖෂධ නීති බලාත්මක කිරීමේ නියෝජිතායතනවල ප්‍රධානීන්ගේ රැස්වීම් |
| නොවැම්බර් 03-08 | Green Holidays | ඉන්දියානු MICE කණ්ඩායම |
| නොවැම්බර් 04-05 | Serendivus සම්මන්ත්‍රණය - ගෝලීය අධ්‍යයන පර්යේෂණ ආයතනය | ICAUST 2016 |
| නොවැම්බර් 09 | Luxe Asia | DHFL MICE කණ්ඩායම - 250/270 දෙනෙකු |
| නොවැම්බර් 12-14 | සීමාසහිත ඒට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම ස්පාර්ක් කැපිටල් |
| නොවැම්බර් 11-14 | ඒෂයන් ඇඩ්වෙන්චර්ස් ට්‍රැවල් මැනේජ්මන්ට් සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - අශෝක් ලේලන්ඩ් |
| නොවැම්බර් 14-15 | TIIKM | පක්ෂීන්, ජෛව විවිධත්වය සහ සංචාරක කර්මාන්තය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය |
| නොවැම්බර් 16-18 | | Intex South Asia 2016 |
| නොවැම්බර් 15-17 | ශ්‍රී ලංකා රක්ෂණ සංගමය | 12 වන අන්තර්ජාතික ක්ෂුද්‍ර රක්ෂණ සම්මන්ත්‍රණය 2016 |
| නොවැම්බර් 18-22 | වෝකර්ස් ටුවර්ස් | ඉන්දියානු MICE කණ්ඩායම - මැට්‍රික්ස් හෙල්ත්කෙයාර් ෆර්මා |
| නොවැම්බර් 30 සිට දෙසැම්බර් 04 | ලයන්ස් ශ්‍රී ලංකා | සිංහ සමාජය - 44 වන ISAAME සංසදය |
| දෙසැම්බර් 02 | ගෝලීය අධ්‍යයන පර්යේෂණ ආයතනය | ICS 2016 |
| දෙසැම්බර් 01-07 | ජෙට්වින්ග් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - Regaliya MICE කණ්ඩායම |
| දෙසැම්බර් 02-06 | NATANDA International | NATFEST 2016 |
| දෙසැම්බර් 15-16 | TIIKM | නැනෝ විද්‍යා සහ නැනෝ තාක්ෂණික සම්මන්ත්‍රණය 2016 |
| දෙසැම්බර් 15-16 | සීමාසහිත ඒට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම | ඉන්දියානු MICE කණ්ඩායම - Akhil Bharatiya Sanskrutik Sanskrutik Sangh (ABSS) |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

## මූල්‍ය හා පරිපාලනය

මූල්‍ය හා පරිපාලන අවශ්‍යතාව පරිදි, ප්‍රගති වාර්තා, කාර්ය සාධන වාර්තා, සාමාන්‍ය කාර්යසාධන හා ප්‍රගති වාර්තා, ක්‍රියාකාරී සැලසුම්, ක්‍රියාකාරකම් වාර්තා ආදිය ඇතුළත්ව විවිධ ආයතනවලට ඉදිරිපත් කළ යුතු සියලු වාර්තා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මගින් ලබා දී ඇත.

## සංවිධාන ව්‍යුහය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව | තනතුරේ දැනට සිටින කාර්ය මණ්ඩල සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 1 | - | 1 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 1 | 1 | - |
| කළමනාකරු | 2 | 1 | 1 |
| සහකාර කළමනාකරු | 3 | 3 | - |
| කළමනාකරණ සහකාර | 2 | 2 | - |
| රියදුරු | 1 | 1 | - |
| කාර්යාල සහායක | 1 | 1 | - |
| එකතුව | 11 | 9 | 2 |

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය

ප්‍රේමකුරේ මහතා - සභාපති
අචිනි දන්දුන්ගේ මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු
කුමුදු හැන්නැදිගේ මිය - කළමනාකරු අලෙවිකරණ
පියුමි පීරිස් මිය - සහකාර කළමනාකරු, පර්යේෂණ, සංවර්ධන, වෙළඳ ප්‍රමිති, සංගම් රැස්වීම්
රංජිකා පෙරේරා මිය - සහකාර කළමනාකරු, ගිණුම් හා පරිපාලනය
චම්පික අනුරාධ මහතා - සහකාර කළමනාකරු, අලෙවිකරණ
අරුන්දති කුමාරි මිය - කළමනාකරණ සහකාර
දිනුෂ්කා ෆොන්සේකා මිය - කළමනාකරණ සහකාර
සංජීව පෙරේරා මහතා - රියදුරු
ප්‍රබෝධ විජේසූරිය මහතා - කාර්යාල සහායක

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2016 දෙසැම්බර් මස 31 වැනි දිනට

| | සටහන | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතේ සහ බැංකුවේ ඇති මුදල් | 6 | 4,886,320.57 | 3,211,876.94 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 7 | 63,951,149.46 | 44,430,635.48 |
| පෙර ගෙවීම් | 8 | 266,072.80 | 285,863.83 |
| ලංකා බැංකු අරමුදල් කළමනාකරණය | | 117,606,905.23 | 100,317,290.38 |
| තැන්පතු | 9 | 80,000.00 | 80,000.00 |
| ප්‍රවර්ධනය සඳහා අත්තිකාරම් ගෙවීම් | | - | 4,733,855.70 |
| ලැබිය යුතු රඳවාගැනීමේ / VAT බදු | | - | 450,553.57 |
| මුළු ජංගම වත්කම් | | 186,790,448.06 | 153,510,075.90 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 10 | 19,127,867.38 | 20,830,148.78 |
| අඩුකලා : ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම් | | 13,846,027.04 | 12,082,556.78 |
| ලියාහල වටිනාකම | | 5,281,840.34 | 8,747,592.00 |
| දීර්ඝ කාලීන ආයෝජන | | 26,648,658.01 | 25,300,000.00 |
| මුළු ජංගම නොවන වත්කම් | | 31,930,498.35 | 34,047,592.00 |
| මුළු වත්කම් | | 218,720,946.41 | 187,557,667.90 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | 11 | 864,863.58 | 319,154.71 |
| මුළු ජංගම බැරකම් | | 864,863.58 | 319,154.71 |
| **දීර්ඝ කාලීන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 1,898,952.00 | 2,177,247.50 |
| මුළු බැරකම් | | 2,763,815.58 | 2,496,402.21 |
| ශුද්ධ වත්කම් | | **215,957,130.83** | **185,061,265.69** |
| **ශුද්ධ වත්කම් / සමකොටස්** | | | |
| සමකොටස් ආරම්භක ශේෂය | | 6,433,492.69 | 6,433,492.69 |
| රඳවාගත් ඉපැයීම් | 12 | 218,627,773.00 | 191,220,766.85 |
| සංචාරක සංවර්ධන අරමුදල | | (40,000,000.00) | (40,000,000.00) |
| වර්ෂය සඳහා ලාභය | | 30,895,865.14 | 27,407,006.15 |
| මුළු ශුද්ධ වත්කම් / සමකොටස් | | **215,957,130.83** | **185,061,265.69** |

පිටු අංක 5 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 10 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

..........................................
ප්‍රේමා කුරේ
සභාපති
ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය

..........................................
එම්. ශාන්තකුමාර්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය

# මූල්‍ය කාර්ය සාධන වාර්තාව

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන | 2016<br>රු. | 2016 අයවැය<br>රු. | 2015<br>රු. | 2015 අයවැය<br>රු. |
|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | |
| තොටුපල බද්ද | | 94,217,651.02 | 93,010,000.00 | 78,741,643.96 | 8,448,000.00 |
| සංචාරක සංවර්ධන බද්ද | | 51,278,967.01 | 47,430,000.00 | 40,807,067.56 | 43,520,000.00 |
| වෙනත් ආදායම් | 13 | 11,128,515.95 | 8,300,000.0 | 6,439,927.06 | 6,000,000.00 |
| **මුළු ආදායම** | | **156,625,133.98** | | **125,988,638.58** | |
| **වියදම** | | | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 14 | 11,818,796.67 | 13,880,000.00 | 10,956,647.10 | 10,220,000.00 |
| සැපයුම සහ භාවිතා කළ පාරිභෝගික ද්‍රව්‍ය | 15 | 7,009,745.86 | 5,870,000.00 | 4,964,463.50 | 5,730,000.00 |
| අළෙවිකරණය හා සම්බන්ධ වියදම | 16 | 102,938,436.23 | 204,645,000.00 | 77,496,622.19 | 164,215,000.00 |
| පර්යේෂණ සහ සංවර්ධන | 17 | 1,199,375.69 | 7,400,000.00 | 3,049,749.09 | 6,100,000.00 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් | 7 | 1,982,364.26 | | 1,991,772.37 | |
| වෙනත් වියදම් | 18 | 765,825.00 | 1,525,000.00 | 605,370.00 | 800,000.00 |
| මූල්‍ය පිරිවැය | 19 | 14,725.13 | 60,000.00 | 27,195.79 | 50,000.00 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | (510,187.61) | |
| | | **125,729,268.84** | | **98,581,632.43** | |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිඟය)** | | **30,895,865.14** | | **27,407,006.15** | |

# ගිණුම් සඳහා සටහන්

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**1. පොදු තොරතුරු**

**ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය (SLCB)**

ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය 2005 අංක 38 දරන පනත යටතේ සංස්ථාගත කර ඇති අතර ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. කාර්යාංශයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය 4 වැනි මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල, අංක 78, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ ස්ථානගතව ඇත.

ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන කාර්යාංශය සම්මන්ත්‍රණ, ඒකාබද්ධ රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර සහ ප්‍රදර්ශන ප්‍රවර්ධනය කිරීමේ නියැලී සිටී.

**2. සකස් කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇති අතර ඓතිහාසික පිරිවැය පදනම ස්ථාවරව අනුගමනය කර ඇත. ආදායම සහ පිරිවැය උපචිත පදනමින් අදාල කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත. අවශ්‍ය අවස්ථාවල අනුප්‍රාප්තික සටහන්වල සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පැහැදිලි කර ඇත. ගිණුම් සඳහා බලපෑම් ඇති කරනු ලබන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

**3. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ**

සියලු දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදීගත් පිරිවැයට හෝ ඉදිකිරීම් පිරිවැය අනුව ඓතිහාසික පිරිවැයට සඳහන් කර ඇත.

හිමිකාරිත්ව කාල පරිච්ඡේදයට අදාලව ක්ෂයවීම් සඳහා පිරිවැය මත වෙන් කිරීම් සිදු කරනු ලැබේ. ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

| වත්කම | අනුපාතය |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| මෝටර් වාහන | 25% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| ගොඩනැගිලි | 5% |

**4. බැරකම් සහ වෙන්කිරීම්**

ශේෂ පත්‍ර දිනට සියලු බැරකම් ගිණුම්වල ඇතුලත් කර ඇත.

**5. විශ්‍රාම ප්‍රතිලාභ**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. අඛණ්ඩ සේවා කාලයේ සෑම වසරක් සඳහාම වර්තමාන මාසික වැටුපෙන් අර්ධයක පදනමින් ආන්තික ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් සිදු කරනු ලැබේ. කෙසේවෙතත්, බැරකම ගෙවිය යුතු වන්නේ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණවීමෙන් පසුව වේ.

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**6. අතේ සහ බැංකුවේ ඇති මුදල්**

| අයිතමය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකුව | (91,794.29) | (1,356,742.86) |
| බැංකුවේ ඇති මුදල් - මහජන බැංකුව | 4,978,114.86 | 4,568,619.80 |
| අතේ සහ බැංකුවේ ඇති මුළු මුදල් ශේෂය | 4,886,320.57 | 3,211,876.94 |

**7. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ**

| අයිතමය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | 441,873.20 | 556,689.20 |
| තොග | 345,252.00 | - |
| උත්සව අත්තිකාරම් | - | 2,500.00 |
| SNAV ලැබිය යුතු | 6,273,477.85 | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 56,890,546.41 | 43,871,446.28 |
| **එකතුව** | **63,951,149.46** | **44,430,635.48** |

**8. පෙර ගෙවීම්**

| අයිතමය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|
| ප්‍රවර්ධන සහා ගෙවීම් | 101,018.37 | 101,018.37 |
| රක්ෂණ | 88,934.51 | 88,934.51 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 66,119.92 | 95,910.95 |
| වෙබ් අඩවිය නඩත්තු කිරීමේ පෙර ගෙවීම් | 10,000.00 | - |
| **එකතුව** | **266,072.80** | **285,863.83** |

**9. තැන්පතු**

| අයිතමය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 5,000.00 | 5,000.00 |
| සී.එෆ්. ද මෙල් ඇන්ඩ් සන්ස් | 75,000.00 | 75,000.00 |
| **එකතුව** | **80,000.00** | **80,000.00** |

**10. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ**
**සටහන් අංක. 2A**

| සටහන | කේතය | විස්තරය | 2016.01.01 දිනට ශේෂය | 2016 එකතු කිරීම් | 2016 එකතු කිරීම් | 2016.12.31 දිනට ශේෂය | 2016.01.01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය | 2016.12.31 දිනට ක්‍රමක්ෂය | 2016.12.31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය | 2016.12.31 දිනට ශුද්ධ පොත් අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.1 | 101 | කාර්යාල උපකරණ | 7,036,330.49 | 212,989.00 | | 7,249,319.49 | 5,703,281.19 | 161,216.02 | 5,864,497.21 | 1,384,822.28 |
| 3.3 | 103 | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 1,777,753.29 | 105,294.60 | | 1,883,047.89 | 1,120,913.34 | 111,898.24 | 1,232,811.58 | 650,236.31 |
| 3.4 | 110 | මෝටර් වාහන | 9,995,500.00 | - | | 9,995,500.00 | 5,039,468.25 | 1,709,250.00 | 6,748,718.25 | 3,246,781.75 |
| | | **උප එකතුව** | **18,809,583.78** | **318,283.60** | | **19,127,867.38** | **11,863,662.78** | **1,982,364.26** | **13,846,027.04** | **5,281,840.34** |

## 11. ණයහිමියන් සහ උපචිත වියදම්

| අයිතමය | 2016 (රු.) | 2015 (රු.) |
|---|---:|---:|
| SLTDA - සුභසාධන සංගමය | 5,100.00 | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | | 3,573.68 |
| කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු | 290,849.00 | 240,383.00 |
| ගෙවිය යුතු E P F | 193,861.40 | 64,954.50 |
| ගෙවිය යුතු උපයන විට බදු | (571.00) | 279.00 |
| ෆීනික්ස් ඔගිල්වි | 1,785.93 | 1,785.93 |
| ගෙවිය යුතු E T F | 32,839.13 | 8,178.60 |
| ඇමෙරිකන් ප්‍රීමියම් | (0.88) | - |
| ග්ලෝබල් ඇකඩමික් රිසර්ච් | 91,000.00 | - |
| එස්.එල්. මෙඩිකල් ඇසෝසියේෂන් | 250,000.00 | - |
| **එකතුව** | **864,863.58** | **319,154.71** |

**සටහන් 12**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

| | ප්‍රාග්ධන සංචිත | රඳවාගත් ඉපැයීම් |
|---|---:|---:|
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,433,492.69 | 191,220,766.85 |
| 2015 වර්ෂය සඳහා ලාභය | 27,407,006.15 | - |
| සංචාරක සංවර්ධන බද්ද TFR | (40,000,000.00) | - |
| 2016 වර්ෂය සඳහා ලාභය | 30,895,865.14 | - |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **6,433,492.69** | **209,523,638.14** |
| **එකතුව** | | **215,957,130.83** |

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2016 රු. | 2016 අයවැය රු. | 2015 රු. | 2015 අයවැය රු. |
|---|---|---|---|---|
| **13. වෙනත් ආදායම්** | | | | |
| **අයිතමය** | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී ආදායම | 21,188.00 | | 27,483.47 | |
| සහභාගීවීමේ ගාස්තු | 5,330,000.00 | | 4,140,000.00 | |
| ඇමතුම් තැන්පතු පොලිය | 2,174,173.38 | | 794,825.80 | |
| වෙනත් ආදායම් | 3,603,154.57 | | 1,477,617.79 | |
| **එකතුව** | **11,128,515.95** | **8,300,000.00** | **6,439,927.06** | **6,000,000.00** |
| **14. වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ** | | | | |
| **අයිතමය** | | | | |
| සේවක වැටුප් | 6,352,892.00 | 7,000,000.00 | 5,602,956.00 | 6,000,000.00 |
| අනියම් සේවක වැටුප් සහ වෙනත් දීමනා | 380,262.71 | 400,000.00 | 509,630.08 | 300,000.00 |
| සභාපතිවරයාගේ දීමනා | 960,000.00 | 1,080,000.00 | 748,000.00 | 720,000.00 |
| සභාපතිවරයාගේ ඉන්ධන සහ වාහන කුලී | 590,350.00 | 600,000.00 | 350,203.48 | 800,000.00 |
| කාර්ය මණ්ඩල අතිකාල | 257,982.97 | 300,000.00 | 261,998.81 | 300,000.00 |
| සේවක අර්ථසාධක අරමුදල | 678,108.75 | 600,000.00 | 502,786.65 | 500,000.00 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 140,151.71 | 200,000.00 | 100,941.39 | 200,000.00 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 482,099.03 | 600,000.00 | 289,363.27 | 200,000.00 |
| කාර්ය මණ්ඩල සුභසාධනය - | | | | |
| ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය | 51,200.00 | 100,000.00 | 347,900.00 | 200,000.00 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 166,600.00 | 200,000.00 | 53,622.50 | 200,000.00 |
| ප්‍රවාහන දීමනා - දේශීය | 116,283.00 | 400,000.00 | 303,318.00 | 300,000.00 |
| පාරිතෝෂිත | 215,857.50 | | 960,032.50 | |
| පැමිණීමේ දිරි දීමනා | 290,849.00 | 600,000.00 | 240,383.00 | 500,000.00 |
| කාර්ය මණ්ඩල ප්‍රවාහන සහ ඉන්ධන දීමනා | 1,136,160.00 | 1,800,000.00 | 685,511.42 | * |
| **එකතුව** | **11,818,796.67** | **13,880,000.00** | **10,956,647.10** | **10,220,000.00** |
| **15. සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික ද්‍රව්‍ය** | | | | |
| **අයිතමය** | | | | |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 837,768.09 | 650,000.00 | 555,388.04 | 600,000.00 |
| දුරකථන | 553,886.43 | 700,000.00 | 614,620.07 | 600,000.00 |
| තැපැල් සහ කුරියර් ගාස්තු | 26,323.55 | 200,000.00 | 64,812.89 | 150,000.00 |
| පොදු කාර්යාලීය වියදම් | 102,555.10 | 500,000.00 | 217,836.13 | 450,000.00 |
| රක්ෂණ | 913,054.79 | 1,000,000.00 | 1,083,985.94 | 900,000.00 |
| නඩත්තුව - කාර්යාලය | 2,132,696.95 | 400,000.00 | 351,352.89 | 380,000.00 |
| වාහන ඉන්ධන | 357,869.50 | 600,000.00 | 504,906.67 | 800,000.00 |
| වාහන නඩත්තුව සහ අලුත්වැඩියාව | 289,648.28 | 300,000.00 | 211,195.98 | 250,000.00 |

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2016 රු. | 2016 අයවැය රු. | 2015 රු. | 2015 අයවැය රු. |
|---|---|---|---|---|
| විවිධ | 25,389.60 | 200,000.00 | 40,364.89 | 200,000.00 |
| කපාහල | 450,553.57 | - | - | - |
| කාර්යාල කුලී | 1,320,000.00 | 1,320,000.00 | 1,320,000.00 | 1,400,000.00 |
| **එකතුව** | **7,009,745.86** | **5,870,000.00** | **4,964,463.50** | **5,730,000.00** |
| **16. අළෙවිකරණ සහ සම්බන්ධිත වියදම්** | | | | |
| **අයිතමය** | | | | |
| විදේශ ප්‍රවර්ධන / වෙළඳපොළ | 57,587,624.38 | 100,700,000.00 | 49,405,557.73 | 102,700,000.00 |
| මුද්‍රණ / නිෂ්පාදනය | 577,021.82 | 13,050,000.00 | 1,565,514.51 | 6,175,000.00 |
| වෙළඳ දැන්වීම් | 3,493,674.35 | 6,250,000.00 | 1,314,756.90 | 6,000,000.00 |
| SLCB වෙබ් අඩවිය | 43,254.97 | 145,000.00 | 47,210.02 | 140,000.00 |
| අළෙවිකරණ වියදම් - වෙනත් | 531,124.98 | 500,000.00 | 812,164.87 | 200,000.00 |
| උත්සව සඳහා සහාය ලබාදීම | 10,005,399.11 | 15,000,000.00 | 8,905,175.24 | 10,000,000.00 |
| ෆැම් ටුවර්ස් | 207,725.00 | 4,000,000.00 | 2,547,712.01 | 4,000,000.00 |
| විශේෂ ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් | 5,780,404.95 | 10,000,000.00 | - | 10,000,000.00 |
| SNAV 2016 | 24,712,206.67 | 55,000,000.00 | 15,000.00 | - |
| MiCE Mart 2015 | - | - | 12,883,530.91 | 25,000,000.00 |
| **එකතුව** | **102,938,436.23** | **204,645,000.00** | **77,496,622.19** | **164,215,000.00** |
| **17. පර්යේෂණ සහ සංවර්ධන** | | | | |
| **අයිතමය** | | | | |
| ICCA සාමාජිකත්වය | 1,023,085.69 | 700,000.00 | 451,703.21 | 600,000.00 |
| දත්ත සමුදාය නඩත්තු කිරීම | - | 500,000.00 | 50,000.00 | 500,000.00 |
| SLCB පුහුණු වැඩසටහන | - | 5,000,000.00 | 554,267.20 | 5,000,000.00 |
| සම්මන්ත්‍රණ ලංසු සඳහා සහාය | 176,290.00 | 1,200,000.00 | 1,993,778.68 | - |
| **එකතුව** | **1,199,375.69** | **7,400,000.00** | **3,049,749.09** | **6,100,000.00** |
| **18. වෙනත් වියදම්** | | | | |
| **අයිතමය** | | | | |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනා | 549,950.00 | 1,225,000.00 | 393,950.00 | 500,000.00 |
| වෘත්තිකයන්ගේ දීමනා | 215,875.00 | 300,000.00 | 211,420.00 | 300,000.00 |
| **එකතුව** | **765,825.00** | **1,525,000.00** | **605,370.00** | **800,000.00** |
| **19. මූල්‍ය පිරිවැය** | | | | |
| අයිතමය | | | | |
| බැංකු ගාස්තු | 14,725.13 | 60,000.00 | 27,195.79 | 50,000.00 |
| **එකතුව** | **14,725.13** | **60,000.00** | **27,195.79** | **50,000.00** |

2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය අතිරික්තය / (හිඟය) | | 27,407,006.15 |
| **මුදල්මය නොවන විචලනයන්** | | |
| ක්‍රමක්ෂය | 761,584.76 | |
| ලැබිය යුතු දෑවල (වැඩිවීම) / අඩුවීම | (6,936,543.05) | |
| ගෙවීම්වල (වැඩිවීම) / අඩුවීම | 830,910.73 | |
| ණයහිමියන් සහ උපචිත වියදම්වල වැඩිවීම / අඩුවීම | (707,999.61) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(6,052,047.17)** |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| අත්තිකාරම් ගෙවීම් | (4,733,855.70) | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | (857,992.39) | |
| ලංකා බැංක් අරමුදල් කළමනාකරණ ගිණුම | (33,421,723.16) | |
| මෘදුකාංග ඉවත් කිරීම | 720,000.00 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(38,293,571.25)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 960,032.50 | 960,032.50 |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (15,978,579.77) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 19,190,456.71 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 3,211,876.94 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඅයිපී/ඒ/එස්එල්සීබී/ 01/16/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 දෙසැම්බර් 13 දින

සභාපති,

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2017 නොවැම්බර් 08 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ(3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයට අදාළව ක්ෂය වියදම රු.1,982,364ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 1,763,470ක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමෙන් ගොඩනැගිලි අළුත්වැඩියා ගිණුමට මාරු කළ රු.1,801,671 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.2,020,565 ක් ලෙස දක්වා තිබූ අතර එම ගැලපීම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයේ මූල්‍ය නොවන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වුවත් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ලෙස දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී කපා හරින ලද ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද රු.447,303 ක ශේෂය මූල්‍ය නොවන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

-----------------------------------------------

අයකිරීමක් නැතිව හෝ නාමික අයකිරීමක් සහිතව බෙදාහැරීම සඳහා තිබෙන තොග ඒවායේ පිරිවැය සහ වත්මන් ප්‍රතිසම්පාදන අගය යන දෙකින් අඩු අගයට මැනිය යුතුවුවද කාර්යාංශය විසින් මුදල් අයකිරීමකින් තොරව බෙදාහැරීම පිණිස තබා ඇති රු. 345,252 වටිනා ප්‍රවර්ධන අයිතම සම්බන්ධයෙන් එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය වෙනුවෙන් ලැබූ ස්ථාවර තැන්පතු පොලිය රු.54,478 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දැක්වීම හා 2016 වර්ෂයට අදාළව ලැබිය යුතු පොලිය රු.79,998 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස, ගිණුම්වල නොදැක්වීම හේතුවෙන් එකතුව රු.25,520 ක් පොලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කළ යුතු ප්‍රවර්ධන අයිතම අවසන් තොගයෙන් පිරිවැය රු.1,358,488 ක් වූ තොගයක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර රු.345,252 ක් ලෙස ඇතුළත් කර තිබූ තොගයද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් යටතේ දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී වැරදීමකින් ප්‍රාග්ධනිත කර තිබුණු ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා දරන ලද වියදම් රු.1,801,671 ක් නිවැරදි කිරීමේදී පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස රඳවාගත් ලාභයට ගැලපිය යුතු වුවත් එය සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 හා 2016 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම් සිදුකර නොතිබූ අතර 2014 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගෙවා තිබුණු රු.198,375 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම හා සේවක අර්ථ සාධක අරමුදල් වියදම් ගිණුම රු.58,272 කින් හා සේවක භාරකාර අරමුදල් වියදම් ගිණුම හා ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම රු.11,652 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පිරිවැය රු. 5,638,960 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනද එකතුව රු.8,363,700 ක්වූ වෙළඳ හා ප්‍රවර්ධන වියදම්වලට අදාළ බිල්පත්වල මුල් පිටපත් හා මුදල් ලද පාර්ශවයේ සනාථ කිරීම් ද විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දීර්ඝ කාලීන ආයෝජන ලෙස රු.26,648,658 ක් දක්වා තිබුණද බැංකු නිවේදන ( Renewal Notice ) අනුව එම ශේෂය රු.27,898,647ක් වූයෙන් රු.1,249,989 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.30,895,865 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,407,006 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,488,859 කින් වර්ධනය වී තිබුණි. වෙළඳ වියදම් රු.25,441,814 කින් වැඩි වී තිබුණද ආදායම රු.30,636,495 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.21,704,200 ක් වූ අතිරික්තය උච්චාවචනය වෙමින් 2016 දී රු.30,895,865 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 29,522,428 ක් වූ කාර්යාංශයේ දායකත්වය විචලනයන් සහිතව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.44,697,026 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 42(2) වගන්තිය අනුව කාර්යාංශයේ පරමාර්ථ පහත පරිදි වේ.

(i) ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් ලෙස සහ පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

(ii) ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වගබලා ගැනීම සඳහා සැලසුම්කළ පොදු ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම.

(iii) ජාත්‍යන්තර කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සම්බන්ධීකරණය කිරීම හා ඊට සහාය දීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් ඒ සඳහා සේවා සැපයීම.

(iv) සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම සහ පොළඹවන සුළු චාරිකාවැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශීය සම්මේලන ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවිධානයන් සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතාව පවත්වා ගැනීම.

(v) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන්වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම.

(vi) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැලී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(vii) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටින යම් සමාගම් හෝ සංවිධාන සමඟ අනුබද්ධ වීම, ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන ගිවිසුම්වලට ඇතුළත්වීම.

(viii) ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම.

(ix) සත්කාරක සේවා ඇතුලුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(x) කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අනුෂාංගික හෝ හිතකර සියළු ක්‍රියා සහ දේ ශ්‍රී ලංකාවේ හෝ අන් ස්ථානවල සිදුකිරීම.

ආයතනයේ අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත අරමුණු අතරින් (ii), (v) , (vi) , (vii) ,(viii) සහ (ix) යන අරමුණු හා පරමාර්ථ මෙතෙක් ඉටුකරගැනීමට නොහැකිව තිබුණි.

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 14 ක් සඳහා රු.මිලියන 212.85 ක් වෙන්කර තිබූ නමුත් වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.මිලියන 104.14 ක් පමණි. එනම් සියයට 49 ක ප්‍රතිශතයකි.

(ඇ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව 2016 වර්ෂයේදී ව්‍යාපෘති 155 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 97 ක් පමණි.

(ඈ) රු.මිලියන 1.2 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව දේශීය සංචාරක සංවිධාන සමඟ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ දැනුවත් කිරීමේ ව්‍යාපෘති 15 ක් සහ රු.මිලියන 5 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව වසර පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ මානව සම්පත් සංවර්ධනය උදෙසා වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කාර්යාංශය විසින් 2016 ඔක්තෝබර් 31 දින සිට 2016 නොවැම්බර් 02 දින දක්වා ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 95,000,000 න් රු.51,000,000 ක් ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙන් දැරීමට අනුමැතිය ලබාදී තිබුණි.

උක්ත සම්මේලනයට අදාළව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සහභාගී වන විදේශිකයන් සංඛ්‍යාව 300 ක් බව ප්‍රංශයේ සංචාරක නියෝජිත ජාතික සංගමයේ ලේකම්ගේ 2016 ජූනි 06 දිනැති විද්‍යුත් තැපැල මඟින් සනාථ කර තිබියදී 2016 සැප්තැම්බර් 15 දිනැති අංක MTD& CRA/2016/23 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සහභාගී වන විදේශිකයන් සංඛ්‍යාව 488 ක් ලෙස ඇතුළත්කර වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණි. මෙහිදී සත්‍ය වශයෙන් විදේශිකයින් සහභාගී වී තිබුණේ 286 දෙනෙකු පමණි.

(ආ) ඉහත සම්මේලනය පැවැත්වීම වෙනුවෙන් කොළඹ තරු පහේ හෝටල්වලින් වෙන් වෙන්ව මිල ගණන් ලබා ගැනීම වෙනුවට, හෝටල්කරුවන්ගේ සංගමයේ සභාපතිගෙන් මිල ගණන් ලබා ගෙන තිබුණි. එම මිල ගණන් සංචාරක සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රය පාදක කරගත් මිලක් බව අනාවරණය විය. 2011 මාර්තු 17 දාතමින් අංක 1697/24 දරන ගැසට් නිවේදනයට අනුව විවේක / රැස්වීම්/ දිරිගැන්වීම්/සම්මන්ත්‍රණ/ප්‍රදර්ශන (MICE) සඳහා ඉන්වොයිස් කළ මිලෙන් සියයට 10ක් අඩුකළ යුතු අතර එසේ අඩු නොකිරීම නිසා හෝටල් 4 ක් සඳහා රු.740,306 ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 සැප්තැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල ඇමුණුම පරිදි හෝටල් කාමර සඳහා බදු සමඟ ගෙවීමට එකඟ වී තිබුණ මුදල තනි කාමර සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 169 ක් සහ ද්විත්ව කාමර සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 180 ක් වුවත්, ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 169.78 සිට 188.93 දක්වා ගෙවීම්කර තිබීම හේතුවෙන් හෝටල් 4 සඳහා රු.329,592 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) සම්මේලනය පැවැත්වීම වෙනුවෙන් ප්‍රංශ සංචාරක නියෝජිත ජාතික සංගමයෙන් අයකළ යුතු මුදල්වලින් ගුවන් ගමන් ගාස්තු වෙනුවෙන් රු.4,029,000 ක් අඩු කර තිබුණ ද එය අඩුකිරීමට හේතු හා එය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී අරමුදල් කළමනාකරණ ගිණුමේ රු.110,000,000 ක පමණ සාමාන්‍ය මුදල් ශේෂයක් පැවතියදී එය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර ඉහළ පොලී ආදායමක් ලබාගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති හා ව්‍යාජ තොරතුරු ඇතුළත්කර ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍රයක් පදනම් කරගෙන සාමාන්‍යාධිකාරීවරයෙක් බඳවා ගෙන 2016 දෙසැම්බර් සිට 2017 ජනවාරි දක්වා කාලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.483,372ක මුදලක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2016 මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 04 දින වූයෙන් දින 34 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 හි අවශ්‍යතාවයන්ට අනුව ආසන්න වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල හා උපායමාර්ගික සැලැසුම් සමාලෝචනය කර කළමනාකරණයේ වගකීම ක්‍රියාකාරී සැලැස්මෙන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සහ සැලසුම් කරන ලද කාලයට අදාළව ළඟාකරගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ඉටුවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් හෝ පරීක්ෂාවට ලක් කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

සමලෝචිත වර්ෂයේදී ගිණුම් විෂයයන් 21 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 29 සිට සියයට 433 ක් දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලෙඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සංසන්දනාත්මකව තොරතුරු ඉදිරිපත් නොකිරීම. |
| (ආ) තොග පාලනය | ප්‍රවර්ධන තොගයට අදාළ සියළුම අයිතම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

# ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

**ලිපිනය :**

04 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල,
අංක. 78, ගාලු පාර,
කොළඹ - 03
ශ්‍රී ලංකා

**දුරකතනය :** + 94 11 4865050/1 2440002

**ෆැක්ස් :** + 94 11 2472985

**විද්‍යුත් ලිපිනය (s) :** slcb@sltnet.lk

**වෙබ් අඩවිය :** www.visitsrilanka.net